

අංක
07 නිස්ස ආරියරත්න

මෙවර පාර්ලිමේන්තු මැතිවරණයට ජාතික ජන බලවේගයෙන් මනාප අංක 07 යටතේ මොනරාගල දිස්ත්‍රික්කයට තරඟ කරන නිස්ස ආරියරත්න මහතා කැලණිය විශ්වවිද්‍යාලයෙන් සමාජ විද්‍යා දර්ශණපති උපාධියද, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා විශේෂ උපාධිය ලබා ඇත. අතර, කොළඹ විශ්වවිද්‍යාලයෙන් ප්‍රජා සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධියද, දකුණු අප්‍රිකාවේ නයිල් විශ්වවිද්‍යාලයේ ආචාර්ය උපාධි අපේක්ෂකයෙකු ලෙසද විශේෂ අධ්‍යාපන සුදුසුකම් ලබා ඇත. කොළඹ විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාවද හදාරා ඇති අතර ආරියරත්න මහතා ආසියානු සංවර්ධන බැංකුවේ විශේෂ ව්‍යාපෘති අංශයේ මධ්‍යම හා දකුණු ආසියානු කලාපයේ අන්තර්ජාතික සමාජ සංවර්ධන උපදේශකයෙකු ලෙස කටයුතු කරයි.



අංක
08 ඩබ්ලිව්. නිහාල්

මෙවර පාර්ලිමේන්තු මැතිවරණයට ජාතික ජන බලවේගයෙන් මොනරාගල දිස්ත්‍රික්කයට තරඟ වදින ඩබ්ලිව්. නිහාල් මහතා මෝ/ බලහරුව විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය හදාරා ඇති අතර, මාතර මහා මන්තින්ද පිරිවෙන් විද්‍යායතනයේ ද්විතීක අධ්‍යාපනයද, පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධියක් කැලණිය විශ්වවිද්‍යාලයෙන් සාමාජීය විද්‍යාපති පශ්චාත් උපාධියක් ලබා ඇත. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙන් පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක් ලබා ඇත. 2005 වසරේ ගුරු වෘත්තියට පිවිසි ලංකා ගුරු සේවක සංගමයේ විධායක සභාව නියෝජනය කරමින් වැල්ලවාය කලාප ලේකම්වරයා ලෙස කටයුතු කරයි. ජනතා විමුක්ති පෙරමුණේ වැල්ලවාය තිථපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වරයා ලෙස ප්‍රාදේශයේ වන අලි ගැටළුව, ඉඩම් ප්‍රශ්න, ගොවි බිම් වල ජල ගැටලු, ආදිය පිළිබඳව ජනතාව වෙනුවෙන් පෙනී සිටී අයෙකි. බලහරුව සරණ සහන සේවා පදනමේ සභාපති වරයා ලෙසද කටයුතු කරන මොහු කණමල්විල ආදර්ශ ප්‍රාථමික විද්‍යාලයේ ගුරුවරයෙක් ලෙස සේවය කරන අතර ජාතික ජන බලවේගයේ මොනරාගල දිස්ත්‍රික් විධායක සභාව නියෝජනය කරයි.




අංක
09 රුවන් විජේවීර

මෙවර පාර්ලිමේන්තු මැතිවරණයට ජාතික ජන බලවේගය වෙනුවෙන් අංක 09 යටතේ මොනරාගල දිස්ත්‍රික්කයට තරඟ කරන රුවන් විජේවීර ගුණරත්න සහෝදරයා මෝ/ මහානාම ජාතික පාසලේ අධ්‍යාපනය ලබා මහවැලි ජාතික අධ්‍යාපන පීඨයෙන් ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාවත්, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ආන්තර්ජාතික සබඳතා පිළිබඳ ඉංග්‍රීසි මාධ්‍ය ශාස්ත්‍රවේදී උපාධියත් ලබා ඇත. මෝ/ මහානාම ජාතික පාසලේ ප්‍රධාන ශිෂ්‍ය නායකයා ලෙසත්, ශිෂ්‍යභට කණ්ඩායමේ නායකයා ලෙසත්, ළමා ලේඛක සංගමයේ සභාපති ලෙසත්, පාසල් ජනමාධ්‍ය සංගමයේ සභාපති ඇතුළු පාසල් කටයුතු වලදී කැපී පෙනෙන ශිෂ්‍ය ක්‍රියාකාරිකයෙකු විය. මෝ/ දුටුගැමුණු ජාතික පාසලේ නියෝජ්‍ය විදුහල්පති මෝ/නියඳැල්ල කතිෂ්ඨ විද්‍යාලයේ විදුහල්පති හා මෝ/මහානාම ජාතික පාසලේ විදුහල්පතිවරයා ලෙසද කටයුතු කර ඇත. ශ්‍රී ලංකා චීන මිත්‍රත්ව සංගමයේ මොනරාගල දිස්ත්‍රික් ලේකම්වරයා ලෙසද කටයුතු කරමින් සමාජය තුළ විවිධ වගකීම් දරා ඇති සහෝදරයෙකි.



ජාතික ජන බලවේගය
தேசிய மக்கள் சக்தி
JATHIKA JANA BALAWEGAYA (NPP)



පොහොසත් රටක්
ලස්සන ජීවිතයක් වෙනුවෙන්
මාලිමාව දිනවමු!

ගෞරවනීය ස්වාමීන් වහන්ස, පූජකතුමනි,
ආදරණීය මවුවරුනි, පියවරුනි, සහෝදර, සහෝදරියනි, දු-දරුවනි,

පසුගිය ජනාධිපතිවරණයේදී අපි, රටට ශාපයක්ව පැවැති ප්‍රභූ දේශපාලනයට අභියෝග කර එය තීරණාත්මකව පරාජය කිරීමේ පළමු පියවර තැබුවෙමු. එම ජයග්‍රහණය සමග සදාචාරසම්පන්න නව දේශපාලන සංස්කෘතියක් කරා අප ගමන් කරමින් සිටිමු. ආර්ථිකය මැනවින් කළමනාකරණය කරමින් සාධනීය ජයග්‍රහණ ලබමින් සිටිමු. ලොව පුරා රාජ්‍යතාන්ත්‍රිකයින්ගේ විශ්වාසය දිනා ගනිමින්, ජාත්‍යන්තර සම්බන්දතා ශක්තිමත් කර ගනිමින් සිටිමු.

ඉන් නොනැවතී, අප රට පොහොසත් රටක් බවට පත් කර, ශ්‍රී ලාංකේය ජාතිය ගොඩනංවා ඔබට ලස්සන ජීවිතයක් ලබා දීමට අප විසින් තවත් දහසක් කාර්යයන් කිරීමට අදිටන් කරගෙන සිටිමු. දැන් අප ඉදිරියේ ඇත්තේ, ඔබ අප කෙරෙහි තැබූ විශ්වාසය, ව්‍යවස්ථානුකූල බලයකින් බල ගන්වා, ඔබ වෙනුවෙන් වැඩ කිරීමට ශක්තිමත් පාර්ලිමේන්තු කණ්ඩායමක් තෝරා ගැනීමේ තීරණාත්මක මොහොතය.

සිත් තුළ දරාගත්, නොනැසී පැවති සිහින සැබෑ කරගැනීම වෙනුවෙන් ඓතිහාසිකව ඔබ ජනාධිපතිවරණයේදී ඉටු කළ යුතුකම, ස්ථිරසාර වූවක් බවට පත් කරමු. ඒ වෙනුවෙන්, මාලිමාවට ඡන්දය ලබා දී විශිෂ්ට, ජනතාවාදී පාර්ලිමේන්තු බලයක් ගොඩනගමු.

පොහොසත් රටකට මොනරාගල අපේ කණ්ඩායම



මොනරාගල දිස්ත්‍රික් කණ්ඩායම් නායක

අංක **2**

ආර්.එම් ජයවර්ධන

2024 පාර්ලිමේන්තු මැතිවරණයට ජාතික ජන බලවේගයෙන් තරඟ කරන අපේක්ෂක කණ්ඩායමට නායකත්වය සපයන ආර්.එම් ජයවර්ධන සහෝදරයා මො/ නිශ්ශංක මහා විද්‍යාලයෙන් වාණිජ අංශයෙන් උසස්පෙළ හදාරා 1985 වර්ෂයේ දිස්ත්‍රික්කයේ ප්‍රථමයා බවට පත්වෙයි. ඉන්පසු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණ පීඨයට ඇතුලත් වන මොහු විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලනය පිළිබඳව විශේෂවේදී උපාධිය ලබා ගනී. ශිෂ්‍ය ව්‍යාපාරයට සම්බන්ද වී වසර 4ක් කටයුතු කරමින් අවසන් වසරේ මහා ශිෂ්‍ය සංගමයේ සභාපති බවට පත්වී. මර්දනකාරී අවදියේ ශිෂ්‍ය ව්‍යාපාරයට නායත්වය දෙන ලදී. විශ්ව විද්‍යාල ජීවිතයෙන් පසු ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ පරිපාලන නිළධාරියෙකු ලෙස පත්වන ඔහු විධායක නිළධාරියෙකු ලෙස වසර 10ක් අල්ලසින් වංචාවෙන් තොරව රාජකාරී කරන ලදී. 2024 රැකියාවට සමු දී ඌව පළාත් සභා මැතිවරණයට තරඟ කොට මනාප ලැයිස්තුවේ දෙවැනි තැනට පත්වී. ඌව පළාත් සභාව නියෝජනය කරන ලදී. 1986 වසරේ ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ වන ජයවර්ධන සහෝදරයා ඉතා මර්දනකාරී තත්ත්වය තුළ පුර්ණ කාලීනව දේශපාලන කටයුතුවල යෙදෙන අතර 1990න් පසු පක්ෂය තහනම් මොහොතේ,මර්දනකාරී තත්ත්වය හමුවේ වුවද ශිෂ්‍ය ව්‍යාපාරය හරහා අරමුණ වෙනුවෙන් පෙනී සිටින ඔහු පක්ෂය පසුබෑමට ලක්වූ සෑම අවස්ථාවකම අරමුණ අත් නොහැර පෙනීසිටින ලදී. 2024 වසරේ සිට මේ දක්වා පුර්ණ කාලීනව දේශපාලන කටයුතු කරන ඔහු 2008 වසරේ සිට මේ දක්වා ජනතා විමුක්ති පෙරමුණේ මොනරාගල දිස්ත්‍රික් සංවිධායක ලෙසත් 2018 වසරේ සිට ජාතික ජන බලවේගයේ මොනරාගල දිස්ත්‍රික් සංවිධායක ලෙස කටයුතු කරමින් වසර 38ක් මෙම දේශපාලන අරමුණ වෙනුවෙන් කැප කරයි.



අංක **4**

සරත් කුමාර

මෙවර පාර්ලිමේන්තු මැතිවරණයට ජාතික ජන බලවේගය වෙනුවෙන් අංක 04 යටතේ මොනරාගල දිස්ත්‍රික්කයට ගරඟ කරන එච්.එම්. සරත් කුමාර සහෝදරයා ශ්‍රී ලංකා නීති විද්‍යාලයෙන් නීති වෘත්තිය පිළිබඳ සුදුසුකම සම්පූර්ණ කර දැනට ශ්‍රේෂ්ඨාධිකරනයේ නීතීඥයෙකු ලෙස කටයුතු කරයි. මීට පෙර ගුරුවරයෙකු ලෙසත්,මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු ලෙසත් රාජකාරී කර ඇති සරත් සහෝදරයා ඌව වෙල්ලස්ස ජන අයිතීන් සුරැකීමේ පෙරමුණේ සභාපති ලෙසත්,ජාතික විඳ්වත් සංවිධානයේ මොනරාගල දිස්ත්‍රිකයේ සභාපති ලෙසත් කටයුතු කරයි. ජාතික ජන බලවේගයේ දිස්ත්‍රික් විධායක සභිකයෙකු වන මොහු බිබිල නීතීඥ සංගමයේ නිවාසු සභාපති වරයාද වේ.



අංක **1**

අජිත් අගලකඩ

මෙවර පාර්ලිමේන්තු මැතිවරණයට ජාතික ජන බලවේගය වෙනුවෙන් අංක 01 යටතේ මොනරාගල දිස්ත්‍රික්කයට තරඟ කරන අජිත් අගලකඩ සහෝදරයා බණ්ඩාරවෙල ශාන්ත තෝමස් විද්‍යාලයෙන් උසස්පෙළ සමත්ව කැලණිය විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී උපාධිය ලබා ඇත. ජාතික විඳ්වත් සංවිධානයේ මොනරාගල දිස්ත්‍රික් ලේකම් ලෙස කටයුතු කරන අජිත් සහෝදරයා මොනරාගල නගරයේ ව්‍යාපාරිකයෙකු ලෙස කටයුතු කරයි. ජාතික ජන බලවේගයේ දිස්ත්‍රික් විධායක සභිකයෙකු ලෙස කටයුතු කරන අතර මොනරාගල එක්සත් ව්‍යාපාරික සංගමයේ සභාපති ලෙස වසර දෙකක්ද කටයුතු කර ඇත.



අංක **5**

මහේෂ් බණ්ඩාර

මෙවර පාර්ලිමේන්තු මැතිවරණයට ජාතික ජන බලවේගය වෙනුවෙන් අංක 05 යටතේ මොනරාගල දිස්ත්‍රික්කයට තරඟ කරන මහේෂ් බණ්ඩාර සහෝදරයා කැලණිය විශ්වවිද්‍යාලයෙන් ඉතිහාසය පිළිබඳ විශේෂවේදී උපාධිධාරියෙකු වන අතර මො/ හබරලු වැව මහා විද්‍යාලයේ ගුරුවරයෙකු ලෙස සේවය කරයි. ඊට අමතරව උපකාරක පංති ප්‍රවීණ දේශකයෙකු ලෙස ප්‍රදේශ රැසක කටයුතු කරන මහේෂ් සහෝදරයා ලංකා ගුරු සේවා සංගමයේ තණමල්විල කලාපයේ නිවාසු ලේකම්වරයාද වේ.



අංක **3**

තරංග බණ්ඩාර

මෙවර පාර්ලිමේන්තු මැතිවරණයට ජාතික ජන බලවේගය වෙනුවෙන් මොනරාගල දිස්ත්‍රික්කයට තරඟ කරන තරංග බණ්ඩාර මහතා මො/ පැල්වත්ත නවෝද්‍යා විද්‍යාලයෙන් උසස් පෙළ සමත්ව ඌව විශ්වවිද්‍යාලයේ කළමනාකරණය පිළිබඳව උපාධිය ලබා ඇත. ඌව විශ්වවිද්‍යාලයේ ප්‍රධාන ශිෂ්‍ය නියෝජිතයා ලෙසත්, පාසලේ ප්‍රධාන ශිෂ්‍ය නායකයා ලෙසත්, මංගල පාසලේ ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ අග්‍රාමාත්‍යවරයා ලෙසත්, ශිෂ්‍ය ප්‍රජාව තුල විශේෂ දක්ෂතා පෙන්වා ඇත. තරංග බණ්ඩාර සහෝදරයා ප්‍රවීන ආර්ථික විද්‍යා දේශකයෙකු ලෙස කටයුතු කරයි. සමස්ථ ලංකා ගොවිජන සම්මේලනයේ ජාතික විධායක සභිකයෙකු, පහල ඌව වෙල්ලස්ස ගොවිජන සම්මේලනයේ සභාපති සහ ජාතික ජන බලවේගයේ දිස්ත්‍රික් විධායක සභිකයෙකු ද වේ.



අංක **6**

චතුරි ගංගානි

මෙවර පාර්ලිමේන්තු මැතිවරණයට ජාතික ජන බලවේගය වෙනුවෙන් අංක 06 යටතේ මොනරාගල දිස්ත්‍රික්කයට තරඟ කරන චතුරි ගංගානි සහෝදරිය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර සංඛ්‍යානය පිළිබඳ විශේෂවේදී උපාධියක් ලබාගෙන මො/ යාලබෝව ප්‍රාථමික විද්‍යාලයේ ගුරුවරියක ලෙස සේවය කරයි. ජාතික ජන බලවේගයේ කාන්තා දිස්ත්‍රික් විධායක සභික මෙන්ම ජාතික ජන බලවේගයේ දිස්ත්‍රික් විධායක සභික ලෙසද කටයුතු කරයි.